# නුවරඑළිය වතු ආශ්‍රිත දමිළ ප්‍රජාවගේ සංස්කෘතික අනන්‍යතාවේ නූතන ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

*බී.එම්.ටී.එල්. බාලසූරිය[1] පී.ටී. ඉසුරු ලක්මාල් චන්ද්‍රසිරි[2] ඒ.ජී.ඒ. සම්පත්[3]*

ශ්‍රී ලංකාවේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ව ජීවත් වන දමිළ ප්‍රජාව ඉන්දීය දමිළ සංස්කෘතික අනන්‍යතාව සහිත පිරිසකි. ඉන්දියානු දමිළ සහ ලාංකිය දමිළ වසයෙන් සිදු වන වර්ගීකරණයේ දී සංස්කෘතික අනන්‍යතාව තුළ බොහෝ දේ නව ප්‍රවණතා ලෙස හඳුනාගත හැකි ය. වතු දමිළ ජනතාව අතර බාහිර සහ අභ්‍යන්තර ව විවිධ සාධක මත සංස්කෘතික ලක්ෂණයන්හි වෙනස්කම් පවතී. අධ්‍යයන ක්ෂේත්‍රය වසයෙන් නුවරඑළිය රම්බොඩ ප්‍රදේශය තෝරාගෙන ඇත්තේ එම තත්ත්වය බහුල ව හඳුනාගත හැකි බැවිනි. නුවරඑළිය වතු ආශ්‍රිත දමිළ ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාව නව ප්‍රවණතා පිළිබඳ ව විශ්ලේෂණය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වේ. වතු ආශ්‍රිත දමිළ ප්‍රජාවගේ සංස්කෘතික ලක්ෂණ වෙනස්වීමට බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය කිරීම සහ සංස්කෘතික වෙනස්කම් හේතුවෙන් එම ජන ජීවිතයට ඇති වන බලපෑම පිළිබඳ ව විමර්ශනය කිරීම පර්යේෂණයේ අනුඅරමුණු වේ. නුවරඑළිය වතු ආශ්‍රිත ජනතාව මුහුණ දෙන සංස්කෘතික නව ප්‍රවණතා වෙනස්වීම් ලක්ෂණ කවරේ ද යන්න පර්යේෂකයා උනන්දු වූ පර්යේෂණ ප්‍රශ්නය වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මේ සඳහා යොදාගෙන ඇත. අරමුණු සහගත නියැදීම යටතේ අසූදෙනකුගෙන් යුත් නියැදියක් මේ සඳහා සම්බන්ධ කරගෙන ඇත. ප්‍රාථමික දත්ත මූලාශ්‍රය යටතේ සම්මුඛ සාකච්ඡා සහ ව්‍යුහගත ප්‍රශ්නාවලිය යොදාගෙන ඇත. ද්විතීක දත්ත මූලාශ්‍රය යටතේ පොත්පත්, පුවත්පත්, සඟරා සහ පර්යේෂණ ලිපි යොදාගෙන ඇත. පදනම් න්‍යාය දත්ත විශ්ලේෂණයට යොදා ගැනිණි. කෝවිලේ දී සිදු වූ විවාහ චාරිත්‍ර වර්තමානයේ බොහෝ විට මංගල උත්සව ශාලාවට සීමා වී ඇත. යම්කිසි පුද්ගලයෙකුගේ අවමංගල්‍ය චාරිත්‍ර දින තුනක් පමණ සිදු වුවත් එය වර්තමානයේ එක් දිනකට හෝ දෙදිනකට සීමා වීම සහ චාරිත්‍ර සිදු වන ආකාරය ද වෙනස් වී ඇත. මෙම ජනතාව අතර පැවති උපසංස්කෘතිකාංග ලක්ෂණ, සාමය සහ සහයෝගිතාව වෙනස් වීම නිසා සමාජ සම්බන්ධතා ජාලය දුරස් වී ඇත. සංස්කෘතිකාංග ලක්ෂණ විවිධාංගීකරණය වීම සහ නව මුහුණුවරක් පෙන්වීම නිසා වතුකරයේ වැඩිහිටි දමිළ ප්‍රජාවට යම්කිසි සමාජමය වසයෙන් බාධාවක් වී ඇති බව අධ්‍යයන ප්‍රතිඵල අතර වැදගත් වේ. තම පුරුදු සංස්කෘතිකාංග වෙනස් වීම සහ නව ප්‍රවණතාවන්ට හුරු වීමට ගත වන කාලය සමස්ත දමිළ ජනතාවට අභියෝගයක් වී ඇති අතර, මේ අනුව දේශපාලනික, ආර්ථික, සමාජ හා සංස්කෘතික වසයෙන් නව ප්‍රවණතා දමිළ සංස්කෘතියට එක් වීමෙන් එහි සංස්කෘතිකමය ව්‍යුහයේ පුළුල් වෙනසක් සිදු වී ඇති බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** උප සංස්කෘතිය, නව ප්‍රවණතා, වතුකරයේ දමිළ ජනතාව, විවාහ සහ අවමංගල්‍ය චාරිත්‍ර, සංස්කෘතික අනන්‍යතාව

[1] සමාජීයවිද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, bmtlakruwan@gmail.com
[2] මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, isurulakmal0929@gamail.com
[3] සමාජීයවිද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, aruna20@gmai.com